චක්‍රලේඛ අංකය : 02/2019
මගේ අංකය : MOJ/AC/22/18
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
කොළඹ 12
2019.05. 03

සියලුම මහාධිකරණ විනිසුරුවරුවන් / දිසා මහේස්ත්‍රාත්වරුන් / මහේස්ත්‍රාත්වරුන්,

<u>රාජසන්තක කරන ලද වැලි හා දැව බැහැර කිරීම.</u>

අංක අමප/19/0977/126/007-I දරණ 2019 අප්‍රේල් මස 10 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජසන්තක කරන ලද වැලි හා දැව බැහැර කිරීමේදී 2019.05.06 දින සිට 2019.12.31 දින දක්වා පහත උපදෙස් අනුගමනය කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

02. ඒ අනුව, රාජසන්තක කරන ලද වැලි හා දැව පූජනීය ස්ථාන වලට හා රාජ්‍ය ආයතන වලට සහන මිලට ලබා දිය හැකිය. රාජසන්තක කරන ලද වැලි අදාළ අධිකරණය මගින්ද රාජසන්තක කරන ලද දැව රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන වෙත ලබාදීමෙන් අනතුරුව රාජ්‍ය දැව සංස්ථාව මගින්ද ලබා දිය යුතුවේ. ඒ අනුව දැව රාජසන්තක කළ වහාම රාජ්‍ය දැව සංස්ථාව වෙත ලබා දීමට කටයුතු කළ යුතුය.

03. (i) පූජනීය ස්ථාන සම්බන්ධයෙන් වන වැලි හා දැව පිළිබඳ ඉල්ලීම අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව ආගමික කටයුතු විෂය භාර අමාත්‍යාංශය වෙත යොමු කළ යුතු අතර එම අමාත්‍යාංශය විසින් තම නිර්දේශය සහිතව එම ඉල්ලීම සඳහා ප්‍රමුඛතා අනුපිළිවෙලින් කටයුතු කිරීම සඳහා අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

(ii) රජයේ දෙපාර්තමේන්තු සඳහා වන වැලි හා දැව සම්බන්ධව ඉල්ලීම් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කළ යුතු අතර එම අමාත්‍යාංශය විසින් සිය නිර්දේශය සහිතව එම ඉල්ලීම සඳහා ප්‍රමුඛතා අනුපිළිවලින් කටයුතු කිරීමට අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

04. (i) ඉහත ආකාරයට වැලි හා දැව ලබා ගැනීම සම්බන්ධව ඉල්ලීම් ඇමුණුම් 01 හා 02 ආකෘති පත්‍ර අනුව ඉදිරිපත් කළ යුතුය. එම ආකෘති පත්‍ර අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ www.moj.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

(ii) අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මගින් අනුමැතිය ලබා දීමෙන් පසු එම ඉල්ලීම අවශ්‍ය කටයුතු සඳහා අදාළ අධිකරණ වෙත හෝ රාජ්‍ය දැව සංස්ථාව වෙත යොමු කෙරෙනු ඇත.

(iii) මෙම අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු දින 90 ක් ඇතුළත රාජසන්තක කරන ලද වැලි අදාළ අධිකරණයෙන් ලබා ගත යුතු අතර, රාජසන්තක කරන ලද දැව දින 180 ක කාලයක් ඇතුළත ලබා ගත යුතුය. කෙසේ වුවද මෙම සියලු අනුමැතීන් 2019.12.31 දිනෙන් අවලංගු වනු ඇත.

05. (i) පූජනීය ස්ථාන හෝ රජයේ දෙපාර්තමේන්තු සඳහා රාජසන්තක කරන ලද වැලි ලබා දීමේදී බස්නාහිර පළාත තුල වැලි කියුබ් 01 රු 2500/- ක් සහ අනෙකුත් පළාත් තුළ වැලි කියුබ් 01 ක් 1500/- ක සහන මිලක් යටතේ ලබා දිය යුතුය.

(ii) පූජනීය ස්ථාන හෝ රජයේ දෙපාර්තමේන්තු සඳහා රාජසන්තක කරන ලද දැව ලබා දීමේදි දිස්ත්‍රික් කමිටු මිළ ගණනින් 50% සහන මිලට ලබා දිය යුතුය. මෙය රාජ්‍ය දැව සංස්ථාව මඟින් සිදු කරනු ඇත

06. (i) ඉහත ආකාරයට සහන මිලට වැලි හා දැව නිකුත් කිරීමේදී එක් ආයතනයක් වෙත නිකුත් කළ හැකි උපරිම සීමාවන් පහත පරිදි වේ.

| | |
|---|---|
| උපරිම වැලි ප්‍රමාණය | - වැලි කියුබ් 10 |
| උපරිම දැව ප්‍රමාණය | - දැව කියුබික් අඩි 100 |

(ii) ඊට වැඩි වන සෑම වැලි කියුබ් 01 හා සෑම දැව කියුබික් අඩියක්ම තක්සේරු වටිනාකමට ලබා දිය යුතුය.

(iii) ඒ අනුව වැලි ලබා ගැනීමේදි අදාල අධිකරණය වෙත හෝ දැව ලබා ගැනීමේදි රාජ්‍ය දැව සංස්ථාව වෙත ගෙවීම් කළ යුතුය.

07. රාජසන්තක කරන ලද වැලි වෙන්දේසි කරන ස්ථානයේ හෝ ගොඩගසා ඇති ස්ථානයේ සිට පිටතට ප්‍රවාහනය කිරීමේදි වැලි ලබා ගන්නා පාර්ශවය විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයට නියමිත ගාස්තු ගෙවා ප්‍රවාහන බලපත්‍ර ලබා ගත යුතුය.

08. රාජසන්තක කරන ලද දැව සහන මිලට ලබා දීමේ දී හා වෙන්දේසි කිරීමේ දී රාජ්‍ය දැව සංස්ථා චක්‍රලේඛවල සඳහන් විධිවිධාන රාජ්‍ය දැව සංස්ථාව විසින් අනුගමනය කළ යුතුය.

09. අදාල කාල සීමාව තුළ පූජනීය ස්ථාන හෝ රජයේ දෙපාර්තමේන්තු වෙත ලබා දී ඉතිරි වන වැලි අදාල අධිකරණ මඟින් ද, දැව රාජ්‍ය දැව සංස්ථාව මඟින් ද, සෑම මාස 06 කටම වරක්ම ප්‍රාදේශීය වෙන්දේසියේ විකිණිය යුතුය.

10. ඉහත ආකාරයට ලබා දුන් වැලි පිළිබඳ සවිස්තර වාර්තාවක් අදාල අධිකරණය මඟින්ද දැව පිළිබඳ සවිස්තර වාර්තාවක්, අදාල අධිකරණ වලට ද පිටපත් සහිතව රාජ්‍ය දැව සංස්ථාව මඟින් ද සෑම මාස 03 කට වරක්ම මෙම අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

ආර්.එම්.ඩී.බී.මීගස්මුල්ල,
ලේකම්,
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

පිටපත්: 1 ලේකම්, බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය, කොලඹ 07 - (අ.ක.ස)
2 ලේකම්, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය, කොළඹ 10 - (අ.ක.ස)
3 ලේකම්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය, කොළඹ 02 - (අ.ක.ස)
4 ලේකම්, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය, කොළඹ 03 - (අ.ක.ස)
5 සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - තම දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම සඳහා.
6 ලේකම්- අධිකරණ සේවා කොමිෂන් සභාව - (දැ.ගැ.ස)
7 සාමාන්‍යධිකාරී, රාජ්‍ය දැව සංස්ථාව - (අ.ක.ස)
8 අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා සමීක්ෂන හා පතල් කාර්යංශය - (අ.ක.ස)